සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** කාලය පැය 03 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්න වලදී වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණක් යොදන්න.

01. ග්‍රාහකයා යනු,
(1) සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භකයා. (2) මාධ්‍ය සඳහා සංදේශ සකස් කරනු ලබන්නා.
(3) ප්‍රණිවිඩය ලබා ගන්නා පුද්ගලයා. (4) ප්‍රණිවිඩය ඉදිරිපත් කරනු ලබන්නා.


02. ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයක් නොවන්නේ,
(1) ගින්දර (2) කොළ අතු (3) දුම (4) පෝස්ටර්

03. නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබල ලෙස හා කලාත්මක ලෙස භාවිත කළ හැකි ජනමාධ්‍යක් වන්නේ,
(1) සිනමාව (2) ගුවන් විදුලිය (3) රූපවාහිනිය (4) පුවත්පත්

04. සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ,
(1) විල්බර් ශ්‍රාම් (2) ෂැනොන් හා විවර් (3) චාල්ස් කූලි (4) ඩේවිඩ් කේ බර්ලෝ

05. අවිධිමත් සන්නිවේදන අවස්ථාවක් වන්නේ,
(1) පත්තර (2) ප්‍රදර්ශන (3) කටකතා (4) අත් පත්‍රිකා

06. මෙම රූප සටහන ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියට අනුව සකසා ඇත. A, B, C නිවැරදි පිළිතුර වන්නේ,




(1) සංදේශය / මාධ්‍ය / ග්‍රාහකයා (2) මාධ්‍ය / සංදේශය / ග්‍රාහකයා
(3) ග්‍රාහකයා / මාධ්‍ය / සංදේශය (4) සංදේශය / ග්‍රාහකයා / මාධ්‍ය

07. සහතික පත්‍රයක් දිගු කාලයක් සුරක්ෂිතව තබා ගැනීමට භාවිත කළ හැකි වඩාත් යෝග්‍ය ක්‍රමවේදය වන්නේ,
(1) ඡායාරූප ගත කිරීම (2) ලැමිනේටින් කිරීම (3) ඡායාපිටපත් ලබා ගැනීම (4) කවරයක බහා තැබීම

08. විදුලි බලය නොමැති අවස්ථාවක භාවිත කළ හැකි පන්ති කාමර මාධ්‍ය උපකරණයක් වන්නේ,
(1) අන්තර් ක්‍රියාකාරී පුවරුව (2) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(3) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය (4) කාන්දම් ලෑල්ල

09. ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී සේවාව වන්නේ,
(1) සිරස රූපවාහිනිය (2) ජාතික රූපවාහිනිය (3) ස්වාධීන රූපවාහිනිය (4) ස්වර්ණවාහිනිය

10. ඡායාරූපයක වස්තුව පැහැදිලිව තිබිය දී පසුබිම අපැහැදිලි කිරීමට අවශ්‍ය වූ විට,
(1) වස්තු දුර අඩු කළ යුතුය. (2) ද්වාර වේගය අඩු කළ යුතුය.
(3) නාභි දුර වැඩි කළ යුතුය. (4) කාච විවරය වැඩි කළ යුතුය.

11. ප්‍රදීපාගාර උපක්‍රමයේ දී ඊට සම්බන්ධ පාර්ශව දෙක වන්නේ,

(1) සන්නිවේදකයා හා මාධ්‍ය (2) ග්‍රාහකයා හා මාධ්‍ය

(3) සන්නිවේදකයා හා ග්‍රාහකයා (4) ග්‍රාහකයා හා සංදේශය

12. විද්‍යුත් තැපැල පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් වන්නේ,

A - යවන හා ලැබෙන ලිපිවල පිටපත් තැන්පත් කරගත හැකි වීම.

B - සිතුවම්, ඡායාරූප ආදිය යැවිය නොහැකි වීම.

C - කෙටි කාලයකින් ලොව ඕනෑම ස්ථානයකට යැවිය හැකි වීම.

D - අඩු පිරිවැයකින් සිදුකළ හැකි වීම.

ඉහත අදහස් අතුරින්,

(1) A B හා D පමණක් නිවැරදිය. (2) A C හා D පමණක් නිවැරදිය.

(3) B C හා D පමණක් නිවැරදිය. (4) A B C හා D සියල්ලම නිවැරදිය.

13. අන්තර් පුද්ගල සන්නිවේදනය මගින්,

(1) අනුන් තමන් ගැන සිතන අයුරු දැනගත හැකිය.

(2) තමාට තමා ගැන අවබෝධයක් ලබා දෙයි.


(3) විශාල පිරිසක් සමඟ තොරතුරු හුවමාරු කරගත හැකිය.

(4) දක්ෂ කතිකයෙකු වීමට මඟ සැලසෙයි.

14. සන්නිවේදන ස්වරූප වලට අයත් නොවන්නේ,

(1) ශ්‍රව්‍ය දෘෂ්‍ය සන්නිවේදනය (2) සමූහ ජන සන්නිවේදනය

(3) වාචික අවාචික සන්නිවේදනය (4) ශ්‍රව්‍ය ලිඛිත සන්නිවේදනය



15. රූප සටහනේ දැක්වෙන අවිධිමත් සන්නිවේදන දාමය වන්නේ,

(1) තනි දාමය

(2) ඕපා දූප දාමය

(3) සම්භාවිතා දාමය

(4) පර්ෂද දාමය

16. ජීව දත්ත පත්‍රිකාවක් සැකසීමේදී අනුගමනය නොකළ යුත්තේ,

(1) වර්ණ අකුරු හෝ කඩදාසි යොදා ගැනීම. (2) මාතෘකා තද අකුරින් තැබීම.

(3) මූලික තොරතුරු කෙටියෙන් දැක්වීම. (4) කඩදාසියේ තනි පැත්ත පමණක් භාවිත කිරීම.

17. අභිසාරීතාව යන්නෙන් අදහස් වන්නේ,

(1) අරමුණු සහගත බව (2) අලසකම (3) විනෝද වීම (4) එකට හමුවීම

18. දේශනයකදී වගු ප්‍රස්තාර ඡායාරූප ආදිය පෙන්වීම සඳහා පහසු උපකරණ වන්නේ,

(1) උහිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය (2) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය

(3) බහුවිධ ප්‍රක්ෂේපණ යන්ත්‍රය (4) වර්ණ විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය

19. කෙටි කාලයක් තුළ වැඩි පිටපත් ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා සුදුසු මුද්‍රණ තාක්ෂණය වන්නේ,

(1) උත්තල මුද්‍රණය (2) සමතල මුද්‍රණය (3) ලිතෝ මුද්‍රණය (4) අංකිත මුද්‍රණය

20. පණිවිඩයකට අර්ථය ලබා දෙන ප්‍රධානතම තැනැත්තා වන්නේ,

(1) මාධ්‍ය (2) ග්‍රාහකයා (3) සන්නිවේදකයා (4) සංදේශය

21. කඩදාසිය නිර්මාණය කරන ලද්දේ,

(1) ජෝන් ලොගී බ්ලෙයාඩ් (2) ගුග්ලිමෝ මාකෝනි

(3) තෝමස් අල්වා එඩිසන් (4) සායිලූන්

22. දින මුද්‍රාවක ඇතුළත් අංගයක් නොවන්නේ,

(1) දිනය (2) වේලාව (3) මාසය (4) අත්සන

23. ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රිත පුවත්පත වන්නේ,

(1) කලම්බු ජර්නල් (2) ලක්මිණි පහන (3) ලංකාලෝකය (4) ලංකාදීප

24. භාෂාවේ දෘෂ්‍ය ස්වරූපය වන්නේ,

(1) ලේඛනය (2) කථනය (3) භාෂණය (4) විවරණය

25. ජනසන්නිවේදනය මගින් නූතන සමාජයේ පැවැත්ම කෙරෙහි දැඩි ලෙස බලපෑම් ඇති කරනු ලබන කරුණු අතරින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) පරිභෝජන රටාව වෙනස් කිරීම

(2) රස වින්දනය වෙනස් කිරීම

(3) විවිධ චර්යා ඇති කිරීමට පෙළඹවීම

(4) දෛනික ජීවිතය වෙනස් නොකිරීම

26. නූතන දෘෂ්‍ය මාධ්‍යයකි,

(1) සත්ත්ව නාද (2) දුම (3) ධාරා සටහන් (4) සංගීතය

27. දෙදෙනෙකු අතර සිදුවන කතා බහ කවර සන්නිවේදන වර්ගයට අයත් ද?

(1) පුද්ගලාන්තර සන්නිවේදනය

(2) අන්තර් වර්තී පුද්ගල සන්නිවේදනය

(3) සමූහ සන්නිවේදනය

(4) ජන සන්නිවේදනය

28. ප්‍රක්ෂේපණය නොවන සන්නිවේදන උපකරණයක් වන්නේ,

(1) කදා ප්‍රක්ෂේපණය (2) ක්ෂණික ප්‍රක්ෂේපණය

(3) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය (4) පිටු පෙරළනය

29. යම් කෙනෙක්, යම් කිසිවක්, යම් නාලියකින්, යම් කෙනෙකුට බලපෑමක් සඳහා ඉදිරිපත් කරනු ලබන දෙය සන්නිවේදනයයි. මෙම නිර්වචනය,

(1) ක්ලෝඩ් ෂැනොන් (2) එඩ්වඩ් සැපීර්

(3) හැරල්ඩ් ලැස්වෙල් (4) වොරන් වීවර්

30. පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් නොවන්නේ,

(1) ඩොට් මුද්‍රණ යන්ත්‍රය (2) ඡායා පිටපත් යන්ත්‍රය

(3) ලේසර් මුද්‍රණ යන්ත්‍රය (4) ලැමිනේටින් යන්ත්‍රය

31. තොරතුරු හුවමාරු කිරීමේ උපකරණ අතුරින් වර්තමානයේ භාවිතයෙන් බැහැරව යන උපකරණය වන්නේ,

(1) පේජරය (2) ෆැක්ස් යන්ත්‍රය (3) දුරකථනය (4) විද්‍යුත් තැපෑල

32. භාෂාවක, වාචික භාෂාවක් සහ ලිඛිත භාෂාවක් පැවතීම හඳුන්වන්නේ,

(1) ද්වි මාර්ගික සන්නිවේදනය (2) භාෂා ද්විරූපතාව

(3) ප්‍රතිපෝෂණය (4) අන්තර් පුද්ගල සම්බන්ධතා

33. ලංකා ගුවන්විදුලි සංස්ථාව පිහිටුවන ලද්දේ,

(1) 1949 (2) 1925 (3) 1967 (4) 1919

34. රූපයෙන් දැක්වෙන්නේ කුමන කෝණයක් භාවිත කරමින් ගත් ඡායාරූපයක් ද?



(1) පටු කෝණ

(2) පුළුල් කෝණ

(3) සාමාන්‍ය කෝණ

(4) යුහුමු කෝණ

35. අවාචික සන්නිවේදනයේ සමාජීය සාධකයන්ට අනුව යහළුවන් අයත් වන්නේ,

(1) පොදු අවකාශය (2) පෞද්ගලික අවකාශය

(3) සහෘද අවකාශය (4) සමාජීය අවකාශය

36. ඡායාරූප පුවත්පත් කලාවට අයත් නොවන්නේ,

(1) ප්‍රවෘත්ති ඡායාරූප කලාව (2) දැන්වීම් ඡායාරූප කලාව

(3) කාටූන් කලාව (4) විශේෂාංග ඡායාරූප කලාව

37. කළුලෑල්ල පරිහරණයේ දී සැලකිය යුතු කරුණක් නොවන්නේ,

(1) වචන හා පේළි අතර වැඩි පරතරයක් නොතිබිය යුතුය.

(2) ලෑල්ලේ වමේ සිට දකුණු දෙසට ලිවීම කළ යුතුය.

(3) ලෑල්ල සමස්ත පන්තියටම දර්ශනය විය යුතුය.

(4) පන්තියේ කටයුතු ආරම්භ කිරීමට පෙර ලෑල්ල හිස්ව තිබිය යුතුය.

38. සමාජයේ කුඩාම ඒකකය වන්නේ,

(1) පාසල (2) පල්ලිය (3) පවුල (4) කෝවිල

39. ඡායාරූපයක් ගැනීමේදී පසු කළ යුතු පියවර අනුපිළිවෙලින් ඇත්තේ,

A - මානනය

B - ද්වාරය

C - අනාවරණය

D - නාභිගත කිරීම

(1) A, B හා C (2) B, C හා D (3) C, B හා A (4) A, D හා C

40. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ දී අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීමේ දී දැනට වඩාත් ජනප්‍රිය වූ මෘදුකාංග වන්නේ,

A - ඇඩොබ් පේජ්මේකර්

B - ඇඩොබ් ඉන්ඩිසයින්

C - මයික්‍රොසොෆ්ට් පබ්ලිෂර්

D - කොරල් ඩ්‍රෝ

(1) A, B පමණක් නිවැරදිය.

(2) B, C, D පමණක් නිවැරදිය.

(3) A, C, D පමණක් නිවැරදිය.

(4) A, B, C හා D යන සියල්ල නිවැරදිය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>වැදගත් :</u>

- **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 පසුගිය වර්ෂයේ අ.පො.ස. සා.පෙළ විභාගයේ විශිෂ්ට ප්‍රතිඵල ලැබූ සිසුන් පිළිබඳ ගුවන් විදුලිය, රූපවාහිනිය හා පුවත්පත් යන මාධ්‍ය මගින් විශේෂ වැඩසටහන් ඉදිරිපත් කෙරුණි.

(i) ඉහත මාධ්‍ය වර්ග තුන හඳුන්වනු ලබන සන්නිවේදන වර්ගීකරණය කුමක් ද?

(ii) ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් මාධ්‍ය තුනේ දී ග්‍රාහකයා හඳුන්වනු ලබන නම් වෙන වෙනම සඳහන් කරන්න.

(iii) ඉහත මාධ්‍ය මගින් ඇතිවිය හැකි සන්නිවේදන බාධක වර්ග දෙක නම් කරන්න.

(iv) සන්නිවේදන බාධක පිළිබඳ මුලින්ම ආකෘතියක් මගින් ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(v) භාෂාවේ මූලික කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

(vi) අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිත තාක්ෂණික මෙවලම් දෙකක් නම් කරන්න.

(vii) සංජානනය යනු කුමක් ද?

(viii) සමූහ සන්නිවේදනයේ විශේෂතා දෙකක් සඳහන් කරන්න.

(ix) වාචික සන්නිවේදනයේදී භාෂාව සම්බන්ධයෙන් කථිකයකුගේ අවධානය යොමු විය යුතු අංග දෙකක් සඳහන් කරන්න.

(x) වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි දෙකක් ලියන්න.

(ල.20)

02. කාර්යාලවල අතින් කරන ලද බොහෝ කාර්යයන් වර්තමානය වන විට විද්‍යුත් යන්ත්‍රවලට පැවරී ඇත.

(i) ප්‍රක්ෂේපණය කළ හැකි පන්ති කාමර මාධ්‍ය උපකරණ දෙකක් නම් කරන්න. (ල.01)

(ii) පරිගණකය ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ ප්‍රධාන පියවර හතර නම් කරන්න. (ල.02)

(iii) කාර්යාලයීය මාධ්‍ය උපකරණ තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල.03)

(iv) විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි හතරක් පැහැදිලි කරන්න. (ල.04)

03. ජන මාධ්‍ය සමඟ මහජනයා නිරන්තර ගණුදෙනුවක නිරත වේ.

(i) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හිමිකාරීත්වය පිළිබඳ ප්‍රධාන වර්ගීකරණය නම් කරන්න. (ල.01)

(ii) පුරවැසියෙකු සතු ලක්ෂණ හතරක් නම් කරන්න. (ල.02)

(iii) රජයට අයත් පුවත්පත්, ගුවන් විදුලි හා රූපවාහිනී, ජන මාධ්‍ය ආයතන එක බැගින් නම් කරන්න. (ල.03)

(iv) පුවත්පත් ආයතනයක අභ්‍යන්තර ක්‍රියකාරීත්වයේ අංශ හතරක් පිළිබඳ විස්තර කරන්න. (ල.04)

04. සමාජයක පැවැත්ම සඳහා සන්නිවේදනය අත්‍යවශ්‍ය සාධකයකි.

(i) සන්නිවේදන ස්වරූප හතරක් නම් කරන්න. (ල.01)

(ii) අවිධිමත් සන්නිවේදන ආකෘති දෙකක් ඇඳ නම් කරන්න. (ල.02)

(iii) ඵලදායී ලේඛනයක දැකිය හැකි ලක්ෂණ තුනක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.03)

(iv) සංවිධානයක් තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාර දෙකක් විස්තර කරන්න. (ල.04)

05. සන්නිවේදනය පිළිබඳ පාසල් මාධ්‍ය සංසදය දැනුවත් කිරීමට ඔබට භාරව ඇත.

(i) සන්නිවේදනයේ මූලිකාංග හතරක් නම් කරන්න. (ල.01)

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂතා දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) සන්නිවේදනයේ මූලික කාර්යයන් තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල.03)

(iv) ජන සන්නිවේදනයේ මූලික ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ල.04)

06. මාධ්‍ය උපකරණ භාවිතය, පන්ති කාමරය තුළ ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක වීමට බලපානු ලැබේ.

(i) ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සනාථ කිරීමට හේතු දෙකක් දක්වන්න. (ල.01)

(ii) නිර්වාචික සන්නිවේදන විධික්‍රම හතරක් නම් කරන්න. (ල.02)

(iii) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් ඉදිරිපත් කළ සන්නිවේදන සූත්‍රය ඇඳ නම් කරන්න. (ල.03)

(iv) තොරතුරු හුවමාරුවට අමතරව ජංගම දුරකථනයෙන් ලබා ගත හැකි වෙනත් පහසුකම් හතරක් විස්තර කරන්න. (ල.04)

07. නිශ්චල ඡායාරූපයට පුද්ගලයාගේ නිර්මාණශීලී ඇස හා චින්තනය බෙහෙවින් බලපායි.

(i) නිශ්චල ඡායාරූපයක් යනු කුමක් ද? (ල.01)

(ii) නිශ්චල කැමරාව සඳහා යොදා ගත හැකි කාච වර්ග හතරක් සඳහන් කරන්න. (ල.02)

(iii) නිශ්චල ඡායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි තුනක් කෙටියෙන් සඳහන් කරන්න. (ල.03)

(iv) අංකිත හෙවත් ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතා හතරක් පිළිබඳ විස්තර කරන්න. (ල.04)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**10 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය 1/3**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(1) | 4 -(2) | 5 -(3) | 6 -(1) | 7 -(2) | 8 -(4) | 9 -(3) | 10 -(4) |
| 11-(3) | 12 -(2) | 13 -(1) | 14 -(2) | 15 -(2) | 16 -(1) | 17 -(4) | 18 -(2) | 19 -(2) | 20 -(2) |
| 21-(4) | 22 -(4) | 23 -(1) | 24 -(1) | 25 -(4) | 26 -(3) | 27 -(1) | 28 -(4) | 29 -(3) | 30 -(4) |
| 31-(1) | 32 -(2) | 33 -(3) | 34 -(2) | 35 -(2) | 36 -(3) | 37 -(1) | 38 -(3) | 39 -(4) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01 (i) ජන සන්නිවේදනය

(ii) ගුවන් විදුලිය - ශ්‍රාවකයා / රූපවාහිනිය - ප්‍රේක්ෂකයා / පුවත් පත - පාඨකයා

(iii) මාධ්‍ය බාධක / අර්ථ බාධක

(iv) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර්

(v) සිතීම විධිමත් කිරීම / වාචික ප්‍රකාශනය / සැබෑව හඳුනා ගැනීම / කාලය සන්නිවේදනය / දැනුම සංරක්ෂණය / පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන යාම

(vi) තැපැල් ලිපි / විද්‍යුත් ලිපි / ෆැක්ස් පණිවුඩ / දුරකථ / අන්තර්ජාල දුරකථනය / සමාජ ජාල වැනි නව මාධ්‍ය....

(vii) කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කර ගෙන එය තේරුම් ගැනීම සංජානනයයි.

(viii) ● සමූහය කුඩා හෝ විශාල විය හැකිය. ● සන්නිවේදකයා ඉදිරියේ සිටින සමූහය සන්නිවේදකයා දන්නා අය මෙන්ම නොදන්නා අයගෙන් සමන්විත විය හැකිය. ● සන්නිවේදකයා ඉදිරිපත් කරන අදහසට එකඟ අය මෙන්ම එකඟ නොවන අයද සිටිය හැක. ● බොහෝ විට ඒක පාර්ශවික සන්නිවේදනයක් දක්නට ලැබේ.

(ix) උච්චාරණය, අර්ථ ගැන්වීම, යෝග්‍යතාව

(x) ● තොරතුරු වහාම ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කර ගත හැකි වීම. ● තොරතුරු යාවත් කාලීන කිරීම. ● කාර්යාලයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම. ● කාර්යාලයේ කටයුතු වඩාත් විධිමත්ව හා පිළිවෙළකට කළ හැකි වීම. ● කාර්යාලයේ තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකි වීම.

(ල.20)

02. (i) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය / කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය / ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය / බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය / අන්තර් ක්‍රියාකාරී පුවරුව (ල.01)

(ii) අත්පිටපත සැකසීම / අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම / මුද්‍රණය හා පිටපත්කරණය / නිමි කටයුතු (ල.02)

(iii) දින මුද්‍රා යන්ත්‍රය / නිල මුද්‍රාව / ගණක යන්ත්‍රය / මුදල් ගණින යන්ත්‍රය / පරිගණකය / මුදල් සටහන් යන්ත්‍රය / තැපැල් මුද්‍රා යන්ත්‍රය (ල.03)

(iv) ● ඡායාරූප, සිතුවම්, සුභ පැතුම්පත් යැවිය හැක. ● වේගවත්ව පණිවිඩ යැවිය හැක. ● වියදම අවම වීම. ● රහස්‍ය බව තැපැල් සේවයට වඩා ඇත. ● කාර්යක්ෂම බව. ● එකවර විශාල පිරිසකට තොරතුරු ලබා දිය හැකි වීම. ● යවනු ලබන ලේඛනවල පිටපත් ගබඩා කර ගත හැකි වීම. (ල.04)

03. (i) රාජ්‍ය මාධ්‍ය / පෞද්ගලික මාධ්‍ය (ල.01)

(ii) ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීම / ඡන්ද අයිතිය පාවිච්චි කිරීම / බදු ගෙවීම / නීති ගරුක වීම / සමාජ සුභ සාධනයට කටයුතු කිරීම / දේශාභිමානීව කටයුතු කිරීම / සියලු ආගම් වලට හා සියලු ජාතීන්ට ගරු කිරීම (ල.02)

(iii) ● පුවත් පත් - ලේක් හවුස් ආයතනය මගින් පල කරන පුවත් ● ගුවන් විදුලි - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ● රූපවාහිනි - ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව (ල.03)

(iv) ප්‍රවෘත්ති අංශය / සංස්කරණ අංශය / විශේෂාංග අංශය / ඡායාරූප අංශය / දැන්වීම් අංශය (ල.04)

04. (i) වාචික සන්නිවේදනය / අවාචික සන්නිවේදනය / දෘශ්‍ය සන්නිවේදනය / ශ්‍රව්‍ය සන්නිවේදනය / ලිඛිත සන්නිවේදනය (ල.01)

(ii) ● සන්නිවේදකයා හා ග්‍රාහකයා එකිනෙකා අවබෝධ කර ගනිමින් සන්නිවේදන කාර්යයෙහි නිරත විය හැකිය.
● සන්නිවේදකයාගේ අරමුණු මෙන්ම ග්‍රාහකයාගේ ප්‍රතිචාරයන්ද ඒ අවස්ථාවේම හඳුනා ගත හැකිය.

- වාචික සන්නිවේදනය සමඟ අවාචික සමග අවාචික සන්නිවේදනයද සම්බන්ධ වේ.
- තාක්ෂණික උපකරණ යොදා ගනිමින් දුරස්ථවද සන්නිවේදනයේ නිරත විය හැකිය.
- භාවාත්මක හැඟීම් ප්‍රකාශ කිරීම වඩාත් සක්‍රීය වේ.
- යමක් අවධාරණය කරමින් හා විස්තර කරමින්, නැවත නැවත අදහස් හුවමාරු කළ හැකිය. (ල.02)

(iii) තොරතුරු සම්පාදනය / සමාජානුයෝජනය / අධ්‍යාපනය ලබා දීම / සංවාද හා සාකච්ඡා / විනෝදාස්වාදය ලබා දීම / සංස්කෘතික ප්‍රගමනය / පෙළඹ වීම / සමාජ ඒකාබද්ධතාව (ල.03)

(iv)
- සංදේශය පොදු වූවකි.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.
- සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ.
- වෘත්තීය සන්නිවේදකයින් කටයුතු කරයි.
- තාක්ෂණික උපකරණ භාවිතයට ගනී.
- සාපේක්ෂව ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වේ. (ල.04)

05. (i) සන්නිවේදකයා, ග්‍රාහකයා, සංදේශය, මාධ්‍ය, බලපෑම (ල.01)

(ii) සෘජු ප්‍රතිචාර, ප්‍රතිපෝෂණ ලබාගත හැකිය. / භාවාත්මක හැඟීම් ප්‍රකාශ කිරීම වඩාත් සක්‍රීය වේ...... (ල.02)


(iii) තොරතුරු සැපයීම, අධ්‍යාපනය ලබාදීම, පෙළඹවීම, විනෝදාස්වාදය ...... (ල.03)

(iv) සංදේශය පොදු වූවකි, සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ, සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ, තාක්ෂණික උපකරණ භාවිතයට ගනී (ල.04)

06. (i) එකඟ වේ. හේතු, :-
- ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පහසු වේ.
- ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයහි ඵලදායිත්වය ඉහළ නැංවේ.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් උද්යෝගිමත් හා ආකර්ෂණීය බවට පත් වේ.
- තොරතුරු ග්‍රහණය කර ගැනීමට, තේරුම් ගැනීමට මතකයේ රඳවා ගැනීමට ග්‍රාහකයන්ට පහසු වේ.
- ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය ප්‍රියජනක වේ. (ල.01)

(ii) ශාරීරික ඉගි හා ඉරියව් / ඇඳුම් හා පැළඳුම් / මුහුණේ ඉගි හා ඉරියව් / ස්පර්ශය / ඇස්වල හැසිරීම / ගන්ධය / හඬ, උච්චාරණය හා නිහඬ බව (ල.02)

(iii) (ල.03)




(iv) දින දර්ශනයක් ලෙස / ගණක යන්ත්‍රයක් ලෙස / දර්ශන වීඩියෝ කිරීම / ඡායාරූප ගැනීම / වේලාව දැන ගැනීම / විදුලි පන්දමක් ලෙස / වීඩියෝ ක්‍රීඩා කිරීම (ල.04)

07. (i) නිශ්චල ඡායාරූපයක් යනු දර්ශනයක එක් නිමේෂයක් සටහන් කර ගැනීමකි. (ල.01)

(ii) සාමාන්‍ය කාච / දුර රූප කාච / පටු කෝණ කාච / පුළුල් කෝණ කාච / යුහුමු කාච (ල.02)

(iii)
- අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව.
- තාත්වික බව නිසා ග්‍රාහක විශ්වසනීයත්වය දිනා ගැනීමට හැකිය.
- පහසුවෙන් ග්‍රාහක ආකර්ශනය ලබා ගැනීමට හැකි වීම.
- පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට ඇති හැකියාව.
- ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව. (ල.03)

(iv)
- අඩු ආලෝක තත්වයක් යටතේ වුවත් ඡායාරූප ගත හැකිය.
- අනවශ්‍ය ඡායාරූප මකා දැමිය හැකිය.
- ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේ දී ම නැරඹිය හැකිය.
- විද්‍යුත් තැපැල, අන්තර්ජාලය, ජංගම දුරකථන වැනි සන්නිවේදන ජාලයන්ට පහසුවෙන් යොමු කළ හැකිය.
- ආධුනිකයෙකුට වුවත් පහසුවෙන් මෙහෙයවීම පහසු වේ. (ල.04)